1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(2) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.01.24 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව බාහිර චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/EST/1/1/01-2025(i) හා 2025.01.23 දිනැති ලිපිය හා බැදේ.

02. එමගින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2025.01.22 දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | 02/2024 | 2024.06.20 | වාර්ෂික ස්ථාන මාරු කමිටු සඳහා වෘත්තීය සමිති නියෝජිතයන් පත් කිරීම - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 250(III) |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

අනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: GS/SP/EST/1/1/01-2025[i] | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2025.01.23 |

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාල කර ගැනීම**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක CSS/03/13/CIR.COM.(2) හා 2025.01.11 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් ඉල්ලා සිටි පරිදි, දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, පහත සඳහන් චක්‍රලේඛයෙහි විධි විධාන, දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා 2025.01.22 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව කාරුණිකව දන්වා එවමි.

| චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛයේ අංකය | චක්‍රලේඛයේ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 02/2024 | 2024.06.20 | වාර්ෂික ස්ථාන මාරු කමිටු සඳහා වෘත්තිය සමිති නියෝජිතයන් පත් කිරීම - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 250(III) |

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද, ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛයෙහි පිටපත මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව යොමු කරමි.

එච්.ඩී.ඩී.එස්.ඩබ්. හේරත්
සහකාර ආණ්ඩුකාර ලේකම්,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road, Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

(01)


දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**

**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**

**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை

**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/2-4-34/1/2013

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.06. 20

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 02/2024

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>වාර්ෂික ස්ථානමාරු කමිටු සඳහා වෘත්තීය සමිති නියෝජිතයින් පත්කිරීම - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 250 (III)</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 250 (III) අනුව, එහි සඳහන් අවශ්‍යතා සපුරාලන වෘත්තීය සමිතිවලට වාර්ෂික ස්ථාන මාරු කමිටුවල නියෝජනයක් හිමිවේ.

02. කෙසේ වුවද, වාර්ෂික ස්ථානමාරු කමිටුව වෘත්තීය සමිතියක් නියෝජනය කිරීම සඳහා පහත දැක්වෙන පුද්ගලයින් පත් නොකළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

(අ) විශ්‍රාමික නිලධරයකු

(ආ) අදාළ වාර්ෂික ස්ථානමාරු කමිටුවේ විෂය පථය යටතට ගැනෙන සේවාව / තනතුරට වෙනස් සේවාවක/ තනතුරක නිලධරයකු

(ඇ) අනුමත ස්ථානමාරු පටිපාටියක් අනුව ලබාදුන් ස්ථානමාරු නියෝගයකට අවනත නොවීම හේතුවෙන් කුමන හෝ අවස්ථාවක වරදකරුව සිටින නිලධරයකු

(ඈ) රාජකාරී වැඩ තහනමට හෝ අනිවාර්ය නිවාඩු ගැන්වීමකට ලක්ව ඇති හෝ චෝදනා පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති නිලධරයකු

03. තවද, විමර්ශනයකට ලක්ව සිටින නිලධරයකු ද, ඔහු /ඇය සැකයට භාජනය වී ඇති වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන, වාර්ෂික ස්ථානමාරු කමිටුවකට පත්කිරීම ප්‍රතික්ෂේප කිරීමේ බලය අදාළ ස්ථානමාරු බලධරයාට හිමිවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා/ 02/2024 ... නිකුත් කල ... දින සිට ... 2025.01.22

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

04. යම් වර්ෂයක ස්ථානමාරු කමිටුවකට එම වර්ෂයේ වාර්ෂික ස්ථානමාරු අයදුම්කර ඇති හෝ ස්ථානමාරුවකට යටත්වන නිලධරයකු නම් නොකිරීමට වෘත්තීය සමිති විසින් සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර එසේ නම් කිරීම නොවැළැක්විය හැකි අවස්ථාවක අදාළ නියෝජිතයා තම ස්ථානමාරුවට අදාළ වන තීරණයක් ගැනීමේ ක්‍රියාවලියට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ.දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මෙම රාජ්‍ය ~~පරිපාලන~~ / රාජ්‍ය සේවා කොමිෂන් සභා/ 02/2024 චක්‍රලේඛය / ලිපිය නිකුත් කළ දින සිට ... 2025.01.22 ...

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත